# මහර ප්‍රාදේශිය සභාව.

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මෙම වාර්තාවේ ඇතුළත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහර ප්‍රාදේශිය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

☐

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

(අ) මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ලැබීම්, මුදල් පදනම මත ගිණුම් තැබීමේ ගිණුම් ප්‍රතිපත්තිය අනුගමනය කරන බව ප්‍රකාශිත වුවද, 2010 වර්ෂය තුළ ලැබී තිබූ රු.34,326,698 ක මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් වර්ෂයේ ආදායමට නොගෙන සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ආ) ගෙවිය යුතු එහෙත් ගෙවීමට නොහැකි වූ වියදම්, උපචිත පදනම යටතේ ගිණුම් තැබීම සභාවේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද, 2010 ජනවාරි 01 දිනට රු.57,164,844 ක් වූ ගෙවිය යුතු වියදම් සඳහා ණයහිමි වෙන්කිරීම් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ඉඩම් හා ගොඩනැගිලි ඉදිකිරීම් වල තථ්‍ය පිරිවැය ව රු.2,032,487 ක් ගිණුම්ගත කිරීම වෙනුවට ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.2,214,552 ක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.182,065 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) පොදු, ලිපිද්‍රව්‍ය, විදුලි සහ ආයුර්වේද තොග සම්බන්ධව තොග සමීක්ෂණය කර වටිනාකම් ගිණුම් ගත කිරීම වෙනුවට 2008 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් තිබෙන රු.814,049 ක අතැති තොග ශේෂය සමාලෝචිත වර්ෂයේදීද අවසාන තොග ශේෂය ලෙස ගිණුම් වලට ඇතුළත් කර තිබුණි.

(ඇ) ඉඩම් හා ගොඩනැගිලි උපලේඛනයේ මහර උප කාර්යාලයට අදාලව 2003 වර්ෂයට අදාල ඉඩම් 06 ක වටිනාකම වූ රු.3,556,074 ක් 2008 වර්ෂයේදී ඇතුලත් වී තිබුණි. ඒ අනුව උපලේඛනයේ දැක්වෙන ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණ.

(ඈ) සභාවට අයත්ව ඇති අක්කර 04 පර්චස් 37.4 ක ප්‍රමාණයක ඉඩම්වල වටිනාකම ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඉ) අංක RB 2275 හා 270-0618 ට්‍රැක්ටර් රථ දෙක හා අංක 67-2095 දරන ට්‍රැක්ටර් ටේලරයේ වටිනාකම් ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඊ) ඉඩම් හා ගොඩනැගලි උපලේඛනයේ දැක්වෙන 2003 වර්ෂයේ සභාවට පවරාගෙන තිබූ අක්කර 04 පර්චස් 48.26 ක්වූ ඉඩම් කැබලි 09 ක් සහ ප්‍රමාණය සඳහන් නොවූ සූරියපාලුව එස්ටේට් මැතිව්වත්ත නැමැති ඉඩමේ වටිනාකම ගණනය කර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) 2010 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 34 දෙනෙකුගේ සේවක ඇප මුදල් එකතුව රු.116,362 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඌ) 2010 දෙසැම්බර් 31 දිනට පොලී ගිණුමේ බැර ශේෂ වටිනාකම වූ රු.40,549 ක් හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමෙන් අඩුකර දක්වා තිබුණි.

(එ) 2010 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු රු.46,266 ක දේපළ ණය පොලී, ප්‍රතිපූර්ණ ගිණුම් වලට ඇතුලත් කර නොතිබුණි.

(ඒ) ඉකුත් වර්ෂ වලට අදාල රු.57,494,543 ක ණය හිමියනට කරන ලද ගෙවීම්, සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණ.

(ඔ) ණයහිමි ගෙවීම් ලෙස රු.57,494,543 ක් සමුච්චිත අරමුදලට හර වී තිබුණද, මුදල් පොත අනුව ගෙවීම් රු.57,271,543 ක් විය. ඒ අනුව රු.223,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) ගබඩා තොග ලෙජර් අනුව 2010 දෙසැම්බර් 31 දිනට රු.1,672,077 ක විදුලි උපකරණ තොග ශේෂය සහ රු.3,011,050 ක වෙනත් උපකරණ තොග ශේෂය ගිණුම් ගත කර නොතිබුණ අතර, වර්ෂය තුළ රු.22,174,717 ක ගබඩා තොග ලැබීම් සහ රු.18,624,831 ක තොග නිකුත් කිරීම්ද ගිණුම් ගත කර නොතිබුණි.

(ක) 2010 දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු රු.121,500 ක සහික දීමනා ප්‍රතිපූර්ණ ගිණුම් ගතකර නොතිබුණි.

(ග) 2009 වර්ෂයට අදාලව 2010 වර්ෂය තුළදී ලැබී තිබූ රු.25,234,235 ක ආදායම්, හිඟ හිටි ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.5,910 ක් වූ කැම මේස 06 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ ඇල්දෙණිය පුස්තකාල මාවතේ මාතෘ සායන ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ මායිම් තාප්පයේ කොටසක් ඉදිකිරීමේ පිරිවැය වූ රු.56,986 ක් ප්‍රාග්ධනිත කර නොතිබණි.

1.3.3 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

(අ) ගිණුම් විෂයයන් 02 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.164,407,187 ක් ව අතර, ඒවාට අදාල උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.146,905,393 වුයෙන් රු.17,501,794 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති සේවක ණය උපලේඛනය අනුව නිලධාරීන් 15 දෙනෙකුට අදාල ණය අත්තිකාරම් ශේෂයන්ගේ එකතුව රු.1,730,631 ක් වූ අතර සේවක ණය ලේඛනය අනුව එම ණය අත්තිකාරම් ශේෂයන්ගේ එකතුව රු.1,820,105 ක් වුයෙන් රු.89,474 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

2010 දෙසැම්බර් 31 දිනට මාසික හිඟ ආදායම් ප්‍රකාශය අනුව සහ ශේෂ පත්‍රය අනුව ශේෂයන් අතර, රු.1,780,234 ක වෙනසක් පැවතුණි.

1.3.5 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂ එකතුව රු.45,570 ක් විය.

1.3.6 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.66,796,205 ක්වූ අතර, අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ණයහිමි ශේෂවල එකතුව රු.18,111,959 ක් විය. ආපසු ගෙවිය යුතු රු.30,057,867 ක තැන්පත් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.7 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>

විගණන විමසුම් දෙකකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

(i) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.97,450,436 ක වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ii) 2010 දෙසැම්බර් 24 දින කම්කරුවන් 77 දෙනෙකුට දෛනික වැටුප් වශයෙන් රු.206,570 ක් ගෙවා තිබුණද, අනියම් හා තාවකාලික කම්කරුවන් බඳවා ගැනීමට අදාළව අනුමැතිය, බඳවාගත් කම්කරු සංඛ්‍යාව පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

1.3.8 <u>ලේඛන පවත්වා නොතිබීම</u>

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව පවත්වා ගත යුතු පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි.

| රීතියට යොමුව | ලේඛනය |
|---|---|
| 169 | ඇස්තමේන්තු ලෙජරය (පීඑස් 40) |
| | ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලෙජරය (පීඑස් 41) |
| 217 | ගල් හා බොරළු ලෙජරය (පීඑස් 42) |
| | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය (පීඑස් 46) |

1.3.9 <u>නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති, රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | |
| 24(1)(ආ) | සභාව සතු පාරවල් සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් සකස් කර ගැසට් මඟින් ප්‍රකාශයට |

| | | |
|---|---|---|
| | | පත් කර නොතිබුණි. |
| (ආ) | <u>1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව</u> | |
| (i) | 31 රීතිය | 2010 දෙසැම්බර් 31 දින අගරු වී තිබූ රු.1,740 ක මුදල් ඇණවුම් දෙකක හා රු.26,336 ක චෙක්පත් වල වටිනාකම අදාළ මුදල්, රීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 59 රීතිය | කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (iii) | 143 හා 145 රීති | කෝවල තැන්පතු ගිණුම්, ප්‍රධාන ලෙජර ගිණුම් සමඟ සසඳා නොතිබුණි. තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් එක් එක් වර්ෂය අවසානයේදී සකස් කර නොතිබුණි. |
| (iv) | 168 රීතිය | ලංකා බැංකුවේ ජංගම ගිණුමේ හා පාරිසරික ගිණුමේ ශේෂය වූ රු.31,894,931 ක් හා රු.25,700 ක් වෙනුවෙන් ශේෂ තහවුරු කිරීම් ලබා ගෙන නොතිබුණි. |
| (v) | 178 රීතිය | සේවාවක් හෝ සැපයුමක් ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන පවතින බව සභාව සැලකිල්ලට ගතයුතු වුවද, 2009 වර්ෂයේ දී ලබා ගෙන තිබූ වටිනාකම රු.1,417,986 ක ලෑලි, ජල , විදලි හා දුරකථන බිල්පත් එකතුව රු74,382 ක් සඳහා ගෙවීම් කිරීමේදී අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමකින් හෝ ණය හිමියන් යටතේ ප්‍රතිපාදන වෙන්කර ගැනීමකින් තොරව ගෙවීම් කර සමුච්චිත අරමුදලට හර කර තිබුණි. |
| (vi) | 212 රීතිය | මිලදී ගෙන තිබූ ¾ ගල්, සිමෙන්ති හා 1"x 6" රබර් ලෑලි යනාදී ද්‍රව්‍ය තොග ලේඛන වල ඇතුළත් කර නොතිබුණි. |
| (vii) | 218 රීතිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් පවත්වා |

නොතිබුණි.

(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>

(i) මු.රෙ.396(ඇ) — නිකුත් කල දින සිට මාස 6 ක් ඉක්ම ගිය එකතුව රු.364,605ක් වූ වටිනා චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මු.රෙ.1647 — වාහනභාර නිලධාරීන් විසින් වාහනවල සියළුම තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,429,299 ක්වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,951,750 ක් විය.

2.2 <u>බැංකු සැසඳුම්</u>

(අ) දීර්ඝ කාලයක් තුළ ගිණුම් ගත නොකල/ නිරවුල් නොකළ බැංකු ගාස්තු, වැඩිපුර තැන්පත් කිරීම් සහ අඩුවෙන් තැන්පත් කිරීම් බැංකු සැසඳුම් ප්‍රකාශ වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) එකතුව රු.1,740 ක් වූ මුදල් ඇණවුම් දෙකක වටිනාකම හා එයට අදාළ තැපැල් ගාස්තු, අගරු චෙක්පත් ලෙස බැංකු සැසඳුමට ඇතුළත් කර තිබුණද, තැන්පත් කළ දිනය සහ අදාළ ණයගැතියා ද දක්වා නොතිබුණි.

(ඇ) උපලබ්ධි නොවූ තැන්පතු ලෙස රු.840 ක මුදල් ඇණවුමක් දක්වා තිබූ අතර එම මුදල් ඇණවුම ලැබුණේ කාගෙන්ද යන වග සහ මුදල් ඇණවුම ලබා ගැනීමට හේතුව පැහැදිලි කර නොතිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා අමතන ලද 2011 පෙබරවාරි 07 දිනැති අංක ඩබ්එන්/ප.පා/වි.වා./2011/1 දරන මාගේ ලිපියෙන් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත

ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණද, එකී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3.2 **<u>හිඟ අනෙකුත් ආදායම්</u>**

(අ) පහත පරිදි සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය ආසන්නම වර්ෂ 03 ක හිඟ ආදායම් පිළිබඳ සැලකීමේදී මුළු හිඟ ආදායම් වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරෙන බැවින් ආදායම් එකතු කර ගැනීම යහපත් තත්ත්වයක නොපවතින බව නිරීක්ෂණය වේ.

| දෙසැම්බර් 31 දිනට | හිඟ ආදායම් | | |
|---|---|---|---|
| | වරිපනම් බදු | වෙනත් ආදායම් | එකතුව |
| | රු. | රු. | රු. |
| 2010 | 9,214,819 | 97,610,982 | 106,825,801 |
| 2009 | 10,433,889 | 41,230,961 | 51,664,850 |
| 2008 | 9,368,427 | 47,788,002 | 57,156,429 |
| 2007 | 11,158,541 | 2,455,544 | 13,614,085 |

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට රු.9,214,819 ක් වූ මුළු හිඟ වරිපනම් බදු ශේෂය තුළ මහර හා නාරංවල උප කාර්යාල වලට අදාලව හිඟ වටිනාකම රු.5,000 ඉක්මවූ ශේෂ 230 ක් නිරීක්ෂණයවූ අතර, ඒවායේ එකතුව රු.2,675,384 ක් විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.4 **<u>වියදම් ව්‍යුහය</u>**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **<u>පුනරාවර්තන වියදම්</u>** | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| පෞද්ගලික පඩිනඩි | 39,597 | 34,911 | 4,686 | 33,914 | 31,132 | 2,782 |
| අනෙකුත් | <u>47,032</u> | <u>56,633</u> | <u>(9,601)</u> | <u>39,919</u> | <u>40,027</u> | <u>(108)</u> |
| උප එකතුව | 86,629 | 91,544 | (4,915) | 73,833 | 71,159 | 2,674 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම** | 44,500 | 127,390 | (82,890) | 13,900 | 66,741 | (52,841) |
| මුළු එකතුව | 131,129 | 218,934 | (87,805) | 87,733 | 137,900 | (50,167) |

2.5 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 05 | 05 |
| ද්විතියික | 38 | 31 |
| ප්‍රාථමික | 90 | 78 |
| වෙනත් (අනියම් හා තාවකාලික) | - | 16 |
| | 133 | 130 |

2.6 **හඳුනාගත් පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට ත්‍රිරෝද ටයර් 03 ක හා ටියුබ් 03 ක තොග ඌනතාවයේ වටිනාකම වූ රු.8,346 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.7 **වත්කම් කළමනාකරණය**

2.7.1 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

වත්කම් විෂයයන් 101 ක් නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවති බව භෞතික සම්පත් පිළිබඳව තියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ අතර, එම වත්කම්වල වටිනාකම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.7.2 **අයවීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් වල වටිනාකම රු. 15,082,352ක් වූ අතර, වසරක කාලයක් ඉක්මවූ අය වීමට ඇති රු.173,469 ක ණය ශේෂය ඇතුළත්වී නොතිබුණි.

2.7.3 **අචල ජංගම වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු.834,768 ක් විය.

2.8 **අවිධිමත් ගණුදෙනු**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) **සිමෙන්ති මිලදී ගැනීම**

(i) 2009 ජනවාරි සිට 2010 දෙසැම්බර් දක්වා සිමෙන්ති මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා නොතිබූ අතර, අදාල කාලය තුළ කිලෝ ග්‍රෑම් 50 සිමෙන්ති මලු 28504 ක් රු.800 බැගින්ද සිමෙන්ති මලු 4485 ක් රු.775 බැගින්ද මිලදී ගෙන තිබුණි. මෙම කාලය තුළ සිමෙන්ති මල්ලක උපරිම සාමාන්‍ය සිල්ලර මිල රු.740 ක් ඉක්මවා නොතිබූ බැවින් එම මිල ගණන් හා සලකා බැලීමේදී සිමෙන්ති මිලදී ගැනීමෙන් සභාවට රු.1,867,215 ක ඇස්තමේන්තුගත පාඩුවක් සිදුවී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ සිමෙන්ති මලු 909 ක් සඳහා රු.715,550 ක් ගෙවා තිබූ නමුත් ඒවා ගබඩාවට ලැබුණු බව තහවුරු නොවන අතර, ගබඩාද්‍රව්‍ය භාර ගැනීම් කුවිතාන්සිද නිකුත් කර නොතිබුණි.

(ආ) **වැලි මිලදී ගැනීම**

2009/2010 වර්ෂ වලදී වැලි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර, කියුබ් එකක් සඳහා අවම මිල වූ රු.6,721 (2,375 x 2.83) ක් බැගින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලය අනුමත කර තිබූ නමුත් වැලි කියුබ් එකක් සඳහා රු.8,645 ක් හා රු.7,947 ක් බැගින් වූ මිල ගණන් ගෙවා තිබුණි. මෙම කාල පරිච්ඡේදය තුළ වැලි කියුබ් 2033 ක් සඳහා රු.17,431,048 ක් ගෙවා තිබූ අතර, ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කළ මිල ගණන් නොසලකා කටයුතු කිරීම නිසා සභාවට රු.3,767,255 ක පාඩුවක් සිදුව තිබුණි.

(ඇ) **බැකෝ යන්ත්‍ර කුලී ගෙවීම**

(i) 2009 වර්ෂය තුළදී බැකෝ යන්ත්‍රය යෙදවීම සඳහා රු.8,739,543 ක මුදලක් ගෙවා තිබූ අතර, බැකෝ යන්ත්‍රය යෙදවීමට පෙර අදාළ මාර්ග වල කළ යුතු වැඩ කොටස් හඳුනා ගෙන එක් මාර්ගයක් සඳහා කොපමණ යන්ත්‍ර පැය ප්‍රමාණයක් යෙදවිය යුතුද යන්න ඇස්තමේන්තු කර නොතිබුණි.

(ii) මාර්ග කොන්ක්‍රීට් කිරීමේ කටයුතු සඳහා ධාවන පැයකට රු.1,200 බැගින් ගෙවීමේ පදනම මත බැකෝ යන්ත්‍රයක් සේවයට යොදවා ගෙන තිබුණ අතර, එම යන්ත්‍රය වැඩ බිම් වෙත රැගෙනයාම කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ යුතුව තිබූ කටයුත්තක් වුවත් සභාව ඒ සඳහා දිනකට රු.3,000 බැගින් දින 55 ක් සඳහා රු.165,000 ක් ගෙවා තිබුණි.

(ඈ) <u>ලී කුඩු මිලදී ගැනීම</u>

2010 දෙසැම්බර් මාසයේදී මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා ලී කුඩු කියුබ් 1ක් රු.1,750 බැගින්, කියුබ් 100 ක් මිලදී ගෙන රු.175,000 ක් ගෙවා තිබුණි. අනෙකුත් කර්මාන්ත සඳහා ලී කුඩු යොදා ගෙන නොතිබූ අතර, මෙම කර්මාන්තය සඳහා ලී කුඩු යෙදීමට හේතුවූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඉ) <u>කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර කුලී</u>

සභාව සතුව කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර තිබුණද, කුලී පදනම යටතේ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර ලබාගෙන ඉකුත් වර්ෂයේ අවස්ථා 06 කදී රු.68,000 ක්ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ නියැදි පරීක්ෂණයකට අනුව අවස්ථා 04 කදී රු.24,000 ක්ද ගෙවා තිබුණි. ගම්පහ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු තීරණය අනුව කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් සඳහා දිනක කුලිය රු.2,250 ක් වුවද, ගෙවීම් වලදී දිනකට රු.4,000 බැගින් ගෙවීම නිසා පිළිවෙලින් රු.29,750 ක් හා රු.9,375 ක්, වැඩියෙන් ගෙවා තිබුණි.

2.9 <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u>

පහත කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම යන නිලධාරීන්ට සභාව විසින් ගෙවා තිබූ තාවකාලික විශ්‍රාම වැටුප් රු.929,906 ක් (ආහාර දීමනාව) මහර ප්‍රාදේශීය ලේකම්ගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අවස්ථා දෙකකදී ඉඩම් කට්ටිකර විකිණීම සඳහා වූ අනුමැතිය ලබා දීමේදී පොදු පහසුකම් සැපයීම සඳහා සභාවට පවරාදිය යුතු වූ රු.1 පර්.18.92 ක් වූ ඉඩම් කට්ටි 3 ක හිමිකම් ඔප්පු ලබා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(iii) 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනත අනුව එකතුකළ අගය මත බදු මුදලින් 33 ⅓ % ක් රඳවාගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, අවස්ථා 4 කදී කොන්ත්‍රාත්කරු වෙත කර තිබූ ගෙවීම් වලින් රඳවා ගත යුතුව තිබූ රු.234,669ක් වූ බදු මුදල් රඳවාගෙන නොතිබුණි.

(iv) අවස්ථා 03 කදී, අනතුරුදායක ගස් ු කපා ඉවත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.8,500 ක් සභාව වියදම් දරා ඇති අතර, අදාළ පුද්ගලයන්ට මේ සඳහා දින 07 ක් ඇතුලත රු.14,100 ක් ගෙවන ලෙස දන්වා යවා තිබුණද, මෙම මුදල ගෙවා නොතිබුණ අතර, එය අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 199 වගන්තියේ විධිවිධාන අනුව සභාව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(v) වරිපනම් බදු අය කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීම සඳහා මිලදී ගෙන තිබූ මෘදුකාංගය සේවා කිරීමේ ගිවිසුමකට අනුව සමාලෝචිත වර්ෂයේදී රු.30,000 ක් ගෙවා තිබුණි. අවශ්‍යතාවයට උචිත පරිදි මෘදුකාංගයක් මිලදී ගැනීම කළයුතුව තිබූ බැවින් මෘදුකාංගය සේවා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගිය හැකි බවක් විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

2.10 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

(අ) <u>මල්වතුහිරිපිටිය බටේපොළ සුසාන භූමිය ඉදි කිරීම</u>

මෙම ඉදිකිරීමට අදාළ 2009 මාර්තු 20 දිනැති අවසන් ගෙවීම් වාර්තාව අනුව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල රු.6,504,746 ක් වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ මුළු මුදල රු.7,104,746 ක් වූයෙන් රු.600,000 ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය. මේ පිළිබඳ 2009 අගෝස්තු 17 දිනැති අංක ඩබ්එන්/ජීපී/ඒ/2009/20 (i) දරන විගණන විමසුමෙන් පෙන්වාදී තිබුණද, අවසන් බිල්පතට ගෙවීම් කිරීමේදී අදාළ මුදල අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>කර්මාන්ත ලේඛනය</u>

කර්මාන්ත ලේඛනය යාවත්කාලීන නොකිරීම මත ව්‍යාපෘති ආරම්භ කිරීම, නිමකිරීම, ගෙවීම් කර ඇති ආකාරය හා කර්මාන්ත වෙනුවෙන් තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද යන්න පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි විය.

කර්මාන්ත ලේඛන පවත්වා ගැනීම, ද්‍රව්‍ය ඇණවුම් කිරීම, ද්‍රව්‍ය ලැබීම් තුණ්ඩු නිකුත් කිරීම, ගෙවීම් වවුචර් පිළියෙල කිරීම යන කාර්යයන් එකිනෙක නිලධාරීන් අතරවැඩ බෙදී යන ආකාරයට බෙදා හැර නොතිබුණි.

(ඇ) <u>ඇස්තමේන්තු පිළියෙළ කිරීම</u>

එකම මාර්ගය විවිධ ව්‍යාපෘති යටතේ හෝ අදියර යටතේ ඉදිකළ අවස්ථා නිරීක්ෂණය ව අතර, එම ව්‍යාපෘති යටතේ මාර්ගයේ ඉදි කිරීම කුමන ස්ථානයකින් ආරම්භ කර කුමන ස්ථානයකින් අවසන් වන්නේද යන්න ඇස්තමේන්තු හා ප්‍රමාණ පත්‍රවල නිශ්චිතව සඳහන් කර නොතුිබණි.

(ඈ) <u>ව්‍යාපෘති යොමු සටහන් නොකිරීම</u>

එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වෙනම ව්‍යාපෘති අංකයක් හා ගොනු අංකයක් ලබාදී ඇති අතර, ගෙවීම් වවුචර, මුදල් පොත, වැය ලෙජරය, තොග ලේඛන, භාණ්ඩ ලැබීම් පත්‍රිකා, මිළදී ගැනීම් ඇණවුම්,කර්මාන්ත ලේඛන ආදියෙහි ව්‍යාපෘති අංකය හෝ ලිපිගොනු අංකය යන දෙකම හෝ නිශ්චිත එක් අංකයක් භාවිතා කර නොතිබු බැවින් මේවායේ ඇතුලත් තොරතුරු එකිනෙක පරීක්ෂා කිරීම ඉතා අසීරු කාර්යයක් විය.

(ඉ) <u>කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවීම</u>

(i) කොන්ත්‍රාත්කරුවන්ට හා සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී කර්මාන්ත අංශය විසින් ගෙවීම් වුවචර් පිළියෙල කර ගෙවීම් අංශය වෙත යවා තිබූ අතර, කර්මාන්ත අංශයෙන් ගෙවීම සිදුකළ බවට සටහන් යොදා තිබුණි. එසේ වුවද, ගෙවීම් අංශයෙන් නොගෙවා රඳවාගෙන තිබූ ගෙවීම් වවුචර් පිළිබඳ තොරතුරු කර්මාන්ත අංශය වෙත සන්නිවේදන කර නොතිබුණි.

(ii) ගම නැගුම ව්‍යාපෘති යටතේ ඉදි කිරීම් අවසාන කර ප්‍රාදේශීය ලේකම් විසින් ගෙවීම් සඳහා මුදල් ප්‍රතිපූර්ණය කර තිබූ නමුත් එම මුදල් අදාළ කොන්ත්‍රාත්කරුවනට/ සැපයුම්කරුවන්ට ගෙවීමට කටයුතු කර නොතිබුණි. මෙම මුදල් සභාවේ අනෙකුත් වියදම් වෙනුවෙන් යොදාගෙන තිබූ අවස්ථා විගණනයේදී අනාවරණය විය.

2.11 <u>ගබඩා පාලනය</u>

පහත දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) සිමෙන්ති ගල්, වැලි ආදිය සටහන් කර ඇති තොග ලේඛනයේ ලැබීම් හා නිකුත් කිරීම් සිදුකළ දින සටහන් කර නොතිබූ අතර, මීට අමතරව නිකුත් කිරීමේ නියෝග වල හා ද්‍රව්‍ය භාරගැනීමේ සටහන් වලද දිනයන් සඳහන් කර නොතිබුණි.

(ආ) ද්‍රව්‍ය භාර ගැනීමේ සටහන් වල හා නිකුත් කිරීමේ නියෝගවල තොග ලේඛනයේ පිටු අංක හා නිකුත් කළ දිනයන් සඳහන් කර නොතිබූ අතර, සභාවේ ලේකම්වරයා හෝ ප්‍රධාන ලිපිකරු අත්සන් කර නොතිබුණි. තවද, මේවා ද්‍රව්‍ය ලැබෙන හා නිකුත් කරන අවස්ථාවන්හිදී සටහන් නොකර පසු අවස්ථාවන් වලදී සටහන් යොදා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.12 <u>මහජන පැමිණිලි</u>

සභාව වෙත මහජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සටහන් කරගනු ලබන ලේඛනය යාවත්කාලීන කර නොතිබූ අතර, එවැනි පැමිණිලි, ලේඛනයේ සටහන් කර අදාළ අංශ වෙත යොමු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. මීට අමතරව එවැනි පැමිණිල සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ගයන් පිළිබඳ තොරතුරුද ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

2.13 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඉ) ගබඩා පාලනය